# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ආදි ශිෂ්‍ය සංගමය
# 75 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තා කෙටුම්පත

**දිනය** : 2023 මාර්තු 26 වැනි ඉරු දින

**ස්ථානය** : පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ප්‍රධාන ශාලාව

**වේලාව** : ප.ව. 10.30 ට

**මුලසුන :**
1. එම්. රූපසිංහ මහත්මිය - ධර්මපාල විද්‍යාලයේ විදුහල්පතිනිය/ ගරු සභාපති
2. දීපාල් හේරත් මහතා - ගරු විධායක සභාපති
3. රොහාන් වැලිවිට මහතා - ගරු ප්‍රධාන ලේකම්
4. වසන්ත මල්වත්ත මහතා - ගරු භාණ්ඩාගාරික
5. ලලිත් වැලිකල මහතා - ගරු නියෝජ්‍ය සභාපති
6. ආසිරි ද සොයිසා මහතා - ගරු නියෝජ්‍ය ලේකම්
7. වෙනුර කසුන්සිරි මහතා - ගරු උප සභාපති
8. රුසිරු වගීෂ මහතා - ගරු උප සභාපති
9. එම්. එස්. උපාලි මහතා - උප භාණ්ඩාගාරික
10. ධනංජ ඇල්විටිගල මහතා - ගරු උප සංස්කාරක ඇතුලු සාමාජිකයෝ 102 ක් පමණ

සහභාගී වීම නාම ලේඛනයෙන් තහවුරු කරගන්නා ලදී.

## 75.1 ආරම්භය

සංවත්සර මහා සභාව ආරම්භ කරමින් සභාවේ කටයුතු මෙහෙයවූ අප විධායක කමිටු සාමාජික ජගත් වෙල්ගම මහතා විසින් පැමිණි සැම පිළිගන්නා ලදී. අනතුරුව පැමිණ සිටි සැවම පංච ශීලයේ පිහිටුවා සාම්ප්‍රදායාණුකූලව ජාතික ගීය හා විද්‍යාලයීය ගීතය ගායනා කර ගෞරව දක්වීමෙන් අනතුරුව අප වෙතින් වියෝවූ අනගාරික ධර්මපාලතුමන් සියලු විරුවන්, ආදි ගුරුන් ආදි සිසුන් මෙන්ම අප අතුරින් වියෝවූ සිසු දරුවන් දෙමාපියන් යන සැම සිහිකොට විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වා ගෞරවය ලබාදීම සිදුකරන ලදී.

## 75.2 සභාව පිළිගැනීම

### ගරු විධායක සභාපති දීපාල් හේරත් මහතා

75 වන මහා සභාව වෙනුවෙන් අද දින මෙහි පැමිණ සිටින සියලු සම්භාවනීය ඔබ සැම සේම ගරු සභාපතිතුමිය/විදුහල්පතිතුමිය වන මහේෂිකා රූපසිංහ මැතිණියත් අපගේ හිටපු විදුහල්පති එච්. එස්. කුමාරසිංහ මහතාත් ඉතා ගෞරවයෙන් පිළිගන්නා බවත්, තම ධුර කාලය තුල කටයුතු කල සමස්ත විධායක සභාව ද ඇතුලු පැමිණි සිටි සාමාජික සාමාජිකාවන් සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා බවත් පැවසීය.

එසේම වසර කිහිපයකට පසුව අප විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ සංවත්සරික මහා සභාවක් පැවැත්වීම තම ධුර කාලය තුළ අවශ්‍ය පහසුකම් සලසා ගත හැකිවීම පිළිබඳ ආඩම්බර වන බවත් එය සාර්ථක කර ගැනීමට ඉත සිතින් කැපවෙමින් කටයුතු කළ සියලු දෙනාටම තම ස්තූතිය පල කරන බවත් පැවසීය.

එසේම මෙම වසර අප ආදි ශිෂය සංගමයට වසර 75ක් සපිරෙන වසරක් වීම ද සුවිශේෂි වන බව ද මෙම වසර තුළ ප්‍රධාන ව්‍යාපෘතියන් ලෙස සැමගේ නොමසුරු දායකත්වය මත ප්‍රධාන ශාලාවේ වැඩ අවසන් කිරීමට නායකත්වය ලබාදීමට හැකිවීම පිළිබඳ සතුටක් ඇති බව ද පැවසීය.

## 75.3 පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම.

### ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතා

න්‍යායපත්‍රානුකූලව ගරු ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතා විසින් 74 වන මහා සභාවේ වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවේ සංශෝධනයන් ලෙස 74.9 යටතේ 2019/2021 නිළධාරි මණ්ඩලය වෙනුවට 2022/2023 ලෙස නිවැරදි විය යුතු බවත් ඒ අනුව එම සංශෝධනයන්ට යටත්ව ප්‍රදීප් උඩුවන මහතාගේ යෝජනාවෙන් හා අජන්තා රණවීර මහත්මියගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## 75.4 74 වන මහා සභාවේ දී ඉදිරිපත් කල විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සභාගත කිරීම.

ගරු ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතා විසින් මෙම විශේෂ මහා සභා වාර්තාව සභාගත කරන ලදී. මෙම විශේෂ මහා සභාව කැඳවන ලද්දේ නව ව්‍යවස්ථා සංශෝධන 02ක් සඳහා බවත්, එනම් යාවජීව සාමාජික ගාස්තු සංශෝධනය හා නියෝජ්‍ය සභාපති ධූරය සම්බන්ධයෙන් බවත් පැවසීය.

මෙම විශේෂ මහා සභා වාර්තාවේ එන සංශෝධනයන්ට අදාළ යෝජනා 2022/03/27 වැනි දින පැවති සංවත්සරික මහා සභාවේ දී අනුමත වී ඇති බව ද පවසන ලදී.

මෙම විශේෂ මහා සභා වාර්තාවේ සංශෝධනයන් සම්බන්ධයෙන් අනුර අබේරත්න මහතා, දුමින්ද සංජීව බාලසූරිය මහතා, ප්‍රදීප් උඩුවන මහතා, ගාමිණී විජයසේකර මහතා හා හරේන්ද්‍ර වැලිවිට මහතා අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදි.

මෙම යෝජනා අතර සංශෝධන අංක 02 නියෝජ්‍ය සභාපති ධූරය සඳහා වන 13.9.3 උප වගන්තිය අහෝසි කර 13.3 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට නියෝජ්‍ය සභාපති අනිවාර්යයෙන්ම විධායක සභාපති ධූරයට පත්වීම වෙනුවට " විධායක සභාපති ධූරය සඳහා තත් කාලීන විධායක සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් හා අනුශාසක මණ්ඩලයේ නිර්දේශයෙන් මහා සභාවේ අනුමැතියෙන් පත්කර ගත යුතුය" යන්න පිළිබඳ මතවාදයක් ගෙන දැක්වූ අතර 13.3 උප වගන්තිය හා අනු වගන්තිය සංශෝධනය පිළිබඳ තමා යෝජනාවක් නොගෙනා බව දුමින්ද සංජීව බාලසූරිය මහතා පෙන්වා දෙන ලදි. එයට ප්‍රතිචාර දැක්වූ අනුර අබේරත්න මහතාගේ යෝජනාව වූයේ සංශෝධන සහිත යෝජනාව අනුශාසක මණ්ඩලයට යොමුකොට අනෙකුත් අනුබද්ධ වගන්ති හා උප වගන්ති සංශෝධනය කිරීම සඳහා බලය මහා සභාවෙන් විධායක සභාවට පැවරිය යුතු බවයි.

ඉහත කරුණු අනුව උප වගන්ති හා අනු වගන්ති සංශෝධනය සඳහා විධායක සභාවට බලය නොපැවරූ බවත් ඒ පිළිබඳ කතිකාවතක් විශේෂ මහා සභාවේ දී ඇති නොවූ බැවින් මෙය සඳහන් වීම නිවැරදි විය යුතු බව පෙන්වා දුනි. කාලීන අවශ්‍යතාවය මත ව්‍යවස්ථා සංශෝධන කඩිනමින් සිදු බව පිලිගන්නා බව එම අදහස් දක්වන අයගේ මතය විය. නමුත් යමක් සංශෝධනය කිරීමෙදී සංශෝධනයන් සිදුකිරීමේදී අදාළ අනු වගන්ති හා උප වගන්තින් ද සංශෝධනය නොවී පරිපූර්ණ සංශෝධනයක් සිදුකල නොහැකි බව අනුර අබේරත්න මහතා පෙන්වා දුනි.

ඕනෑම සංශෝධනයක් ස්ථිර කිරීම හා බලාත්මක කිරීම මහා සභාව සතු බලයක් බවත් විධායක සභාවට එම බලය ව්‍යවස්ථානුකූලව හිමිනොවන බවත් පෙන්වා දුන් හරේන්ද්‍ර වැලිවිට මහතා අද මෙම සභාවේ දී මෙම සංශෝධන ඉදිරිපත් කොට අනුමත කර ගත හැකි බවද පැවසීය. ඒ අනුව විශේෂ මහා සභාවේ දී අනුමත කරගත් 02 කොටස බලාත්මක වන්නේ මහා සභාවෙන් අනුමත වූ පසු බවත් (2023/03/26) පෙන්වාදුනි.

හරේන්ද්‍ර වැලිවිට මහතාගේ යෝජනාව අනුමත කිරීම තමා විසින් සිදුකරන බව ප්‍රදීප් උඩුවන මහතා පැවසීය. අනු වගන්ති සංශෝධනය විධායක සභාව සතු කාර්යයක් නොවන බවද එසේ සිදුකොට ඇත්නම් තමා පෞද්ගලිකවම ඊට විරුද්ධ වන බව ද තවදුරටත් පවසන ලදී.

ඕනෑම අවස්ථාවක ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකිරීමේදී සාමාජික අදහස් ලබාගැනීම අත්‍යවශය බවද තමාද මේ සඳහා යෝජනා අදහස් ලබාදුන් බවත්, ඒවා සැලකිල්ලට ගෙන ඇති බව විශ්වාස කරන බවද පැවසීය. මෙවන් තත්ත්වයක් ඉදිරියට ඇතිවීම වලක්වා ගැනීම මෙම උත්තරීතර මහා සභාවේ වගකීම වන බවද පෙන්වා දෙන ලදි.

මෙම විශේෂ මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් ලෙස ස්ථිර කිරීමට හරේන්ද්‍ර වැලිවිට මහතා විසින් ගෙන ආ යෝජනාව ගාමිණී විජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

## 75.5 75 වන විධායක සභාවේ ප්‍රගති වාර්තාව සභාගත කිරීම.

75 වන විධායක සභාවේ ගරු විධායක සභාපති දීපාල් හේරත් මහතා විසින් තත්කාලීන වර්ෂය් ප්‍රගති වර්තාව සභාගත කරන ලදී.

විමර්ෂණයට භාජනය කරන ලද වර්ෂය තුළ ප්‍රගති සාලෝචනයට අනුව 2022 මාර්තු මස 27 වැනි ඉරුදින අංක : 250, අරුව්වල පාර, පන්නිපිටිය "සල්සාවිලා" උත්සව ශාලාවේදී 74 වන විධායක සභාව පැවැත්වූ බවත් ලැබී තිබූ නාමයෝජනා සහ ව්‍යවස්ථානුකූලව අදාළ නිළධාරීන් තෝරා පත්කර ගත් බවත් පවසන ලදී.

විධායක සභා රැස්වීමෙන් අනතුරුව ආදි ශිෂ්‍ය සුහඳතාවය වර්ධනය කිරීම සඳහා Black & White සාදය සල්සා විලා උත්සව ශාලාවේ දීම පැවැත්වූ බව පවසන ලදී.

එසේම දශක හා අනු කණ්ඩායම් වල නියෝජිතයින් හා නව විධායක සභිකයින් පත්කර ගැනීම 2022 අප්‍රේල් මස 10 වන දින පැවති මංගල විධායක සභා රැස්වීමේ සිදුකළ බවත් කාලීන අවශ්‍යතාවය මත ගරු විධායක සභාපති බලතල මත විධායක සභාව සඳහා නීතීඥ උදය ජයවර්ධන මහතා, විශ්‍රාමික බ්‍රිගේඩියර් තුසිත කරුණාරත්න මහතා හා වරලත් වාස්තු විද්‍යාඥ දමින්ද ප්‍රසාද් මහතා යෝජනා ස්ථිරත්වයෙන් තෝරාපත් කොට ගත් බව පැවසීය.

ප්‍රථම විධායක සභාව පැවති දින අපගේ අනුශාසකවරුන්, විනය කමිටු සාමාජිකයින් සමග සියලු විධායක සභිකයින් රැස්වූ බවත් එදින සමූහ ඡයාරූපයක් සඳහා පෙනී සිටි බවත් සටහන් කොට තිබුණි.

2022-2023 විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ 39 දෙනෙකුගෙන් යුතු විධායක සභාවේ පැමිණීමේ ලේඛන වාර්තාව ද ඉදිරිපත් කොට තිබුනි. ඉන් 50% පැමිණීම තහවුරු කොට ඇති සාමාජික සංඛ්‍යාව 17ක් බවද සටහන්ව තිබුණි.2022/2023 වර්ෂය තුළ විධායක සභා රැස්වීම් 13 ක්, කළමණාකරණ රැස්වීම් 03ක් හා විශේෂ විධායක සභා රැස්වීම් 03 ක් පැවැත්වූ බව ද සඳහන් කරන ලදී.

2022 -2023 පරිපාලන වර්ෂය තුළ ඉටුකළ කාර්ය භාරය හා ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකල ව්‍යාපෘතීන් පිළිබඳ සටහන් කොට තිබුණි.

මෙහිදී ගරු විදුහල්පතිතුමියගේ සම්ප්‍රාප්තියත් ආදි ශිෂ්‍ය සංගමය නව දිශානතියකට යොමුවෙමින් සියලු දශක හා අනු කණ්ඩායම් සමග එක්ව ව්‍යාපෘතින් 29 ක් ක්‍රියාත්මක කල බවත් ඒ සඳහා එක් එක් කමිටු වල වගකීම සඳහා කමිටු සාමාජිකයින් නම් කොට ක්‍රියාත්මක කල බවත් ඉන් 50% ඉක්මවවා මේ වන විට වැඩකටයුතු අවසන් කල හැකි වූ බවත් සටහන් කොට තිබුණි.

මෙම කමිටු අතුරින් සංගමයේ ව්‍යවස්ථා සංශෝධන කමිටුවත්, ආදි ශිෂ්‍ය තොරතුරු යාවත්කාලීන කිරීම හා සාමාජික ප්‍රවර්ධණ කමිටුවත්, ප්‍රධාන ශාලා ප්‍රතිසංස්කරණ කමිටුවත් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළ බව සඳහන් කොට තිබුණි.

එසේම ආදි ශිෂ්‍ය සංගමයේ මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ස්ථාපිත කළ "Mini Tuck Shop" අවන්හල ව්‍යාපෘතිය ඉතා සාර්ථක ව්‍යාපෘතියක් වු බව ද මිත්‍රත්ව සංසඳය ප්‍රශංසනීය සේවයක් ඉටු කරන බව ද ප්‍රගති වාර්තාවේ සටහන්ව තිබුණි.

සැම දෙනාගේම අවධානය යොමුවන කටයුත්තක් වන පළමු වසර සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේ කටයුතු වලදී ආදි ශිෂ්‍ය පදනම මත ඇතුළත් වන දරුවන් සඳහා කටයුතු කිරීමට පත්කොට තිබූ කමිටුව විශාල වෙහෙසක් දරා ඉතා නිවැරදි හා අපක්ෂපාති ලෙස කටයුතු කරමින් උපරිම සාධාරණයක් ආදි ශිෂ්‍යයන් වෙනුවෙන් ඉටුකළ බව දන්වා තිබුණි. අයදුම්පත් 103 ක් අතුරින් ආදි ශිෂ්‍යයින්ගේ දරුවන් 65 දෙනෙකු ඇතුළත් කිරීමට හැකිවීම සතුටට කරුණක් වූ බවද සඳහන් කොට තිබුණි.

විද්‍යාලයේ අධ්‍යාපන ප්‍රවර්ධණය හා දම්පල් පරිසරය සුරකීම, ක්‍රිඩා සංවර්ධන ව්‍යාපෘතීන්, ශිෂ්‍යයත්ව හා ශිෂ්‍යාධාර ව්‍යාපෘතින් වල සාර්ථකත්වය පිළිබඳ කරුණු දක්වා තිබුණි.

හිටුප විදුහල්පති කේ. ජී. විමලසේන මහතා වෙනුවෙන් පැවැත්වූ අභිනන්දන ප්‍රණාම උත්සවය, අනගාරික ධර්මපාලතුමාගේ 158 වන ගුණසමරුව, ශ්‍රීමත් අනගාරික ධර්මපාල සමිදු වෙනුවෙන් වන දම්පල් සතිය සාර්ථකව පැවැත්වූ බවත් දක්වා ඇත.

ප්‍රජා සත්කාරක කටයුතු වෙනුවෙන් "අරලිය" කණ්ඩායම, "මුල්පෙළපාලියෝ", "අරුණලු", "පෙරමග" වැනි කණ්ඩායම් තම වාර්ෂික ව්‍යාපෘතින් තුළ සාර්ථක ව්‍යාපෘතීන් සිදුකොට තිබූ බවත් සටහන් කොට තිබුණි.

දම්පල් සංසඳ කණ්ඩායම තම නියමු ව්‍යාපෘතිය ලෙස පාසලේ අධ්‍යාපන සංවර්ධනය සඳහා සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කොට සාර්ථකව පවත්වා තිබුණි.

පෙරමග දශක කණ්ඩායම ද තම වර්ෂය තුළ ව්‍යපෘතින් රැසක් සාර්ථකව නිමකොට තිබූ බවත් "රම්‍ය දිය දහර" වැනි අවධානය යොමු වූ ව්‍යාපෘතීන් ද ක්‍රිකට් තරග, සංගීත ප්‍රසංග, ක්‍රිඩා සංවර්ධන සමගාමී ව්‍යාපෘතින් ද ඒ අතර වූ බව දක්වා ඇත.

අරුණලු කණ්ඩායමේ ප්‍රධානතම ව්‍යාපෘතිය වු ප්‍රධාන ශාලා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් අදියරයේ පවතින බවත් මේ ව්‍යාපෘතියේ නායකත්වය අරුණලු කණ්ඩායම සිදුකල ද සියලු දශක කණ්ඩායම්

අනු බද්ධ කණ්ඩායයම හා සුහ පතන්නන් මේ සඳහා දායකත්වයක් ලබාදුන් බව දක්වා ඇත. මේ වනවිට මිලියන 12 ක මූල්‍ය පිරිවැයක්ද මිලියන 03 ක පසණ ශ්‍රම පිරිවැයක් ද වැයකොට ඇති බවත් , විශේෂයෙන්ම අරලිය කණ්ඩායම විසින් ප්‍රධාන ශාලාවට අවශ්‍ය පුටු 300ක් සඳහා රුපියල් ලක්‍ෂ 40ක් (මිලියන 4ක) මුදලක් ලබා දීම සුවිශේෂි වන බවත් දක්වා ඇත.

ප්‍රචාරන කමිටුවේ කටයුතු අප සංස්කාරක ධනංජ ඇල්විටිගල මහතාගේ පූර්ණ දායකත්වය හා අධීක්‍ෂණය මත සිදු කෙරුණු බවත් ආදි ශිෂ්‍ය සංගමයේ හා පාසලේ සියලුම ප්‍රචාරණයන් හා නිර්මාණාත්මක සැලසුම් පිළිවිතරයන් (BRANDING & VISUAL GUIDE BOOKLET) සැකසීම සිදුවූ බවත් සඳහන්ව ඇත. ඒ මගින් විද්‍යාලයේත් ආදි ශිෂ්‍ය සංගමයේත් කීර්තිය වැඩිකිරිම සඳහා වන ප්‍රචාරණයන් (Branding) නව දිශානිතියකට යොමු වූ බවව ද සඳහන්ව ඇත.

ධර්මපාල - රාහුල වාර්ෂික මහා ක්‍රිකට් තරගයන් 2022-2023 වර්ෂය තුළදී 2021 සඳහා ද 2022 සඳහා ද වන තරග 02 ක් අප විද්‍යාලයේ දි හා  කොළඹ පී. සරවනමුත්තු ක්‍රිඩාංගනයේදී අපගේ සත්කාරකත්වය මත එක් දින තරග ලෙස පැවැත්වූ බවත් එම තරග  02 ම ජයග්‍රහණය ලබාගැනීම සතුටක් බවත් දක්වා ඇත.

අපගේ ක්‍රිකට් ක්‍රිඩකයින්ගේ පෞර්ෂත්වය වර්ධනය සඳහා කොළඹ MCA පරිශ්‍රයේදී  රාත්‍රි භෝජන  සංග්‍රහයක් හා අපගේ ක්‍රිඩාංගනය තුල ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය සඳහා පුහුණු සැසියක් පැවැත්වූ බව දක්වා තිබුණි. මෙම ක්‍රිකට් තරග සඳහා රුපියල් ලක්‍ෂ 12ක් පමණ වැය කොට ඇති බවත් ක්‍රිකට් ක්‍රිඩාවේ සහ ක්‍රිඩාංගනය යාවත්කාලීන කිරීම සඳහා අපගේ විධායක සභික විශ්‍රාමික  බ්‍රිගේඩියර් තුසිත කරුණාරත්න මහතා විශාල දායකත්වයක්  ලබා දී ඇති බවත් පවසන ලදී.

නව ක්‍රිකට් පුහුණුකරු චමින්ද හතුරුසිංහ මහතා සේවයට එක්වීමත් සමගම ඔහුගේ වේතන සඳහා මාස 03ක් රු.60000/- බැගින් රු.180,000/-ක මුදකින් අනුග්‍රහය දැක්වීමට වත්මන් ගරු ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතා කටයුතු කළ බවත් සටහන් කොට තිබුනි.

ආදි ශිෂ්‍ය සංගමයේ 2022-2023 වර්ෂය තුළ සංවිධානය කල Marrons Night Dinner Dance 2023  සාදය තලවතුගොඩ Grand monarch හෝටලයේදී 280ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් ඉතා සාර්ථකව පැවැත්වු බවත් අපගේ කීර්තිමත් ආදි ශිෂ්‍ය කෝලිත වික්‍රමසිංහ මහතා විසින් රුපියල් ලක්‍ෂ 03 ක මූල්‍ය පරිත්‍යාගයක් හා ජ්‍යෙෂ්ඨ ආදි ශිෂ්‍ය වෛද්‍ය ධර්මප්‍රිය විජේසිංහ  මහතා  රුපියල් ලක්‍ෂ  01 ක මුල්‍ය පරිත්‍යාගයක් සිදුකළ බවත්, මේ මුදල් ශිෂ්‍ය ක්‍රීඩා නේවාසිකාරගාර අරමුදල සඳහා පරිත්‍යාග ලෙස ලැබුණ බවත් සඳහන් කොට තිබුණි.

2022- 2023 වර්ෂය තුළ යාවජීව සාමාජිකත්වය 87 දෙනෙකු ලබාගෙන ඇති බවද දක්වා ඇත.

## 75.6 අභාවප්‍රාප්ත නෝමන් රණසිංහ මහතාට ආදි ශිෂ්‍ය සංගමයේ ශෝකය ප්‍රකාශ කිරීම

අපගේ ජ්‍යෙෂ්ඨ ආදි ශිෂ්‍ය හිටපු නියෝජ්‍ය  විදුහල්පති ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපති/ලේකම් ධූර හෙබවූ ස්වර්ණ පද්ම සම්මානයෙන් පිදුම්ලත්, දම්පල් ප්‍රත්‍ර අපගේ ආදරණීය නෝමන් රණසිංහ මහතාගේ වියෝව පිළිබඳ ආදි ශිෂ්‍ය සංගමයේ සාතිශය සංවේගය පළ කරන ලදි.

## 75.7 ධර්මපාල - රාහුල මහා ක්‍රිකට් තරගය - 2023

අප විද්‍යලය හා මාතර රාහුල විද්‍යාලය අතර පවත්වන 12 වන වාර්ෂික මහා ක්‍රිකට් තරගය එළැඹෙන 2023/03/31, 2023/04/01 හා 02 යන තෙදින රාහුල විද්‍යාලයේ සත්කාරකත්වය මත මාතර උයන්වත්ත ක්‍රිඩාංගනයේ දී පවත්වන බව දන්වා සිටින ලදී.

## 75.8 වාර්ෂික මූල්‍ය වාර්තා සභාගත කිරීම

ගරු භාණ්ඩාගාරික වරලත් ගණකාධිකාරි වසන්ත මල්වත්ත මහතා විසින් 2022-2023 වර්ෂයකට අදාළ මූල්‍ය වාර්තා සභාගත කරන ලදී.

විවිධ දුෂ්කරතා හා ආර්ථික අපහසුතා මධ්‍යයේ වුවද විශාල ව්‍යාපෘතීන් කීපයක් සිදුකල වසරක් වූ බවත් අප මේ වන විට අපගේ වත්කම් ලෙස මිලියන 18ක් ඇති බවත් එය මිලියන 180 ක් දක්වා වැඩි කර ගැනීමට අප සැමගේ ඉලක්කය විය යුතු බව පැවසීය. එසේ කල හැකි මානව සම්පතක්,  විද්‍යාලයට ආදරය කරන  අදි සිසුන් රැසක් සිටින බවත් ඔවුන්ගේ ගෞරවය, නිසි තැන හා පිළිගැනීම තුළ ඔවුන් අප හා එක්කර ගත හැකි බවත් ඒ සඳහා වැඩපිලිවෙලක්  සකස් කිරීම සඳහා වන යෝජනා මේ  සභාවෙන් ලැබිය යුතු බවත් පැවසීය.

අපගේ ආදි ශිෂ්‍ය කාර්යාලය නඩත්තුව සඳහා මසකට රුපියල් ලක්ෂ 03ක් පමණ වැය වන බවත්, Mini tuck shop තුළින් ලැබෙන ආදායමෙන් ඒ සඳහා විශාල දායකත්වයක් ලැබෙන බවත් පෙන්වා දුනි.

## 75.9 විද්‍යාලයීය ප්‍රධාන ශාලා ව්‍යාපෘතිය

අප විද්‍යාලයේ අපගේ සළකුණ ලෙස රූපණය වන ස්ථානය ලෙස සැලකෙන ප්‍රධාන ශාලා ගොඩනැගිල්ල මේ වන විට කඩිනමින් ප්‍රතිසංස්කරණය කරමින් සිටින අතර එයට අරුණලු කණ්ඩායමේ නායකත්වය හිමි වී ඇත.

මේ පිළිබඳව මහා සභාව දැනුවත් කිරීම සඳහා අරුණලු කණ්ඩායමේ සභාපති ගිහාන් ආරියරත්න මහතා සහ ලේකම් ශාලක මුතුතන්ත්‍රී මහතා විසින් Power Point presentation ඇසුරෙන් ඉදිරිපත් කිරීමක් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ගරු විදුහල්තුමියගේ ඉල්ලීම හා ගරු විධායක සභාපති දීපාල් හේරත් මහතාගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යාපෘතියක් ලෙස සියලු දශක කණ්ඩායම් හා අනු කණ්ඩායම් වල දායකත්වය හා ආශිර්වාදය මැද සිදු කෙරෙන බවත්, සිදුකරන බවත් මේ වන විට 75% - 80% පමණ වැඩ අවසන් කර අවසන් අදියරයේ පවතින බවත් පවසන ලදී.

මේ වන විට මෙයට රුපියල් මිලියන 12.9 ක් වැයකොට ඇති බවත් ඉන් ශ්‍රම දායකත්වය මිලියන 08ක් පමණ වී ඇති අතර මෙම ශාලාවේ පුටු 300 ලබාගැනීම සඳහා "අසුන්" නමින් ව්‍යාපෘතියක් සැළසුම් කළ නමුත් අරලිය කණ්ඩායමේ අනුග්‍රහයෙන් එම සියලුම පුටු ලැබුණු බවත් ඒ වෙනුවෙන් ඔවුන්ට සැමගේම ප්‍රශංසාව හිමිවිය යුතු බව පැවසීය. මේ සඳහා ඔවුන් රුපියල් මිලියන 4ක් වැය කොට ඇති බව ද පැවසීය.

එසේම දම්පල් සංසද කණ්ඩායම විසින් ලක්ෂ 02 ක් පමණ වටිනා විදුලි පංකා 08 ක් ද අනු කණ්ඩායමත් වන ආදි නෙට්බෝල් සංගමය විසින් රුපියල් 88,000/- ක විදුලි පංකා 18 ක් ද පෙරමග කණ්ඩායම විසින් රු.115,000/- පමණ වන ප්‍රධාන පිවිසුම් දොර ද විදෙස්ගත ආදි ශිෂ්‍යයින් විසින් (World of Palian) රුපියල් මිලියන 02 ක් ද මේ සඳහා ලබාදි ඇති බව පැවසීය.

මෙම ප්‍රධාන ශාලාව ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු කරමින් සිටි පෞද්ගලික කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් වු ගණුදෙණු සම්බන්ධව නීතිමය ගැටලු තත්ත්වයක් තිබූ ගරු විදුහල්පතිතුමියගේ පූර්ණ මැදිහත්වීම මත එය නිරාකරණය කර ගත හැකි වූ බවත් ඒ වෙනුවෙන් ගරු විදුහල්පතිතුමිය හා ඒ සඳහා මදිහත් වූ ආදි සිසුන් සැමට ස්තුතිවන්ත වන බව ද පැවසීය.

අපගේ වත්මන් ගරු ලේකම් රොහාන් වැලිවිට මහතා මෙහි ශබ්ද උපකරණ (Sound Equipment) ලබාදීමට කැමැත්ත ප්‍රකාශ ඇති බව ද, වේදිකාවේ තිර රෙදි හා ශබ්ද පරිපාලන මැදිරිය/ආලෝක පරිපාලන මැදිරිය හා අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා අපගේ ආදි ශිෂ්‍යයෙකු සහාය ලබාදීමට ගරු විධායක සභාපතිතුමාට පොරොන්දු වී ඇති බව ද පැවසීය.

අපගේ ආදි ශිෂ්‍ය සීවලි වන්නිආරච්චි මහතා පෞද්ගලිකවම මැදිහත්ව ප්‍රධාන ශාලාවේ පුටු සැකමේදී එහි තත්ත්ව පරීක්ෂාව සඳහා සහභාගී වූ බවත් එයට ස්තුති වන්ත වන බවත් පැවසීය.

මෙහි වැඩ අවසන් කිරීම සඳහා තවත් රුපියල් මිලියන 12.7ක් වැය වෙතැයි අපේක්ෂා කරන බව ද පැවසීය. මෙම ප්‍රධාන ශාලාව සිසු අයිතියට පාසල වෙත ලබාදීමේ දී මෙය Mini Auditorium/ Mini Theatre ආකාරයෙන් ලබාදීමට සැළසුම් කොට ඇති බවද පැවසීය. තවද වායු සමනය කරන ලද ශාලාවක් ලෙසද අනාගතයේදී සංවර්ධනය කිරීමේ අරමුණක් ඇති බවද පැවසීය.

මෙම ප්‍රධාන ශාලාව සඳහා අත්‍යාවශ්‍යම අංගයක් වන කැසිකිළි අංගනයක් (Wash Room Area) ඉදිකල යුතුව ඇති බවත් ඒ සඳහා සුදුසු කොටසක් ලබාදෙන ලෙස ගරු විදුහල්පතිතුමිය ගෙන් ඉල්ලා සිටින බවත් පැවසීය. එය ලැබෙන්නේ නම් ඒ සඳහා අපගේ ජ්‍යෙෂ්ඨ ආදි ශිෂ්‍යයෙකු එහි සම්පූර්ණ වියදම දැරීමට එකගතාවය පළකර ඇති බව ද පැවසීය.

මෙම අවස්තාවේදී අපගේ "මුල්පෙළ පාලියෝ" කණ්ඩායම විසින් ඉදිරි වැඩකටයුතු සඳහා රුපියල් ලක්ෂ 01 ක මුදලක් පරිත්‍යාග කරන්නට යෙදුනි. ඒ සඳහා එහි ජ්‍යෙෂ්ඨ සාමාජික සුසන්ත ආරියසිංහ මහතා විසින් එම මුදල ගරු විදුහල්පතිතුමිය හා ගරු විධායක සභාපතිතුමා වෙත පිළිගන්වන ලදී.

## පෙරමග කණ්ඩායම වෙනුවෙන් බුද්ධික රොෂාන් මහතා

මෙම ප්‍රධාන ශාලාව මේ අයුරින් නිමවීම සිහින සැබෑවීමක් බවත් පාසල් සමයේ මෙම වේදිකාව මත තැබූ පා සළකුණු මතකයේ සදාතන සිහිවටනයක් බවත්, සැමදෙනාගේම දායකත්වය මත ගොඩනැගෙන මෙම ප්‍රධාන ශාලාව වෙනුවෙන් පෞද්ගලිකවම සුබ පැතුම් එක් කරන බවත් පැවසීය.

නමුත් තමා පෙරමග සාමාජිකයෙකු ලෙස තම කණ්ඩායම විසින් මෙම ව්‍යාපාතිය සඳහා ලක්‍ෂ 26 1/2 ලබාදී ඇති බවත්, මෙහි බිත්ති කපරාරු කිරීම තම කණ්ඩායම සිදුකල බවද මෙම ව්‍යාපෘතියට සමගාමීව ඉදිකල ධර්මපාල කෞතුකාගාරය ද තම කණ්ඩායම විසින් සිදුකළ ව්‍යපෘතියක් බව ද පෙන්වා දුනි.

මෙම ව්‍යාපෘතිය සඳහා වැය වූ මුදල් වලට තම කණ්ඩායමේ දායකත්වය ද ඇතුළත් කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටින බව ද පැවසීය.

හිටපු විදුහල්පති ඕෂාර පණ්ඩිතරත්න මහතාගේ ඉල්ලීම මත තම කණ්ඩායමේ මුදල් ප්‍රධාන ශාලාව ව්‍යාපෘතිය සඳහා ලබාදුන් බවත් තම කණ්ඩායම පාසල තුළ සංස්කෘතික රංග භූමියක් ඉදිරි කිරිමේ සැළසුම සඳහා එකතු කල මුදල් මෙම ව්‍යාපෘතියට ලබාදුන් බවත් පෙන්වා දුනි.

## අරුණලු කණ්ඩායම වෙනුවෙන් ශාලක මුතුතන්ත්‍රී මහතා (ලේකම් - අරුණලු)

තම කණ්ඩායම මෙම ව්‍යාපෘතීය බාර ගත්තේ 2022 මාර්තු මස 20 වන දින බවත් එදින සිට සිදුකල සංවර්ධන කාර්‍යයන් සඳහා වූ මුදල් පමණක් මෙහි සඳහන් වන බවත් පෙන්වා දුනි. පෙරමග කණ්ඩායම පමණක් නොව තවත් ආදි ශිෂ්‍ය දශක කණ්ඩායම් සේම පුද්ගලයන් ද විටින් විට මෙම ව්‍යාපෘතිය සඳහා දායක වී ඇති බවත් එහෙත් වැඩ අවසන් නොවූ බැවින් තම කණ්ඩායම හැකි පමණින් වැඩ අවසන් කිරීමට පෙරටවිත් ක්‍රියාශිලීව කටයුතු කළ බවත් පැවසීය.

මෙ සියලු කටයුතු වලදී සෑම කණ්ඩායමකටම ආරාධනා කල බවත් පෙරමග කණ්ඩායමට ද එලෙස ආරාධනා කල බවත් ඔවුන් සහයෝගය දැක්වීම ප්‍රතික්ෂේප කල බවද පෙන්වා දුනි.

## පෙරමග හිටපු සභාපති චමිඳු විජයවර්ධන මහතා

ආරධනා කළ බවට පවසන දේ ප්‍රතික්ෂේප කරන බව ද නිල වශයෙන් ආරාධනා නොකල බවත්, නමුත් තම සංගමයේ දායකත්වය විවාදයෙන් තොරව ලබදී ඇති බවද පැවසීය.

මේ පිළිබඳ රොෂාන් (අරුණලු කණ්ඩායම) හා තවත් බොහෝ දෙනෙකු (අරුණලු හා පෙරමග සාමාජිකයන්) අදහස් දක්වන ලදි.

## දම්පල් සංසද සභාපති ප්‍රදීප් උඩුවන මහතා

මෙම ව්‍යාපෘතිය සඳහා මුල්ගල තැබුවේ රජය විසින් බවත් එහි වැඩකටයුතු වල ප්‍රමාදය හේතුවෙන් ආදි ශිෂ්‍ය සංගමය මැදිහත්ව කටයුතු කරන බවත් මේ සඳහා සම්පූර්ණ විගණනයක් කර අවසන් වාර්තාවක් ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරන බව පැවසීය. එම යෝජනාව අනුර අබේරත්න මහතා ස්ථිර කරන ලදී.

## 75.10 ලැබුණ ලිපි

ගරු ප්‍රධාන ලේකම්තුමා විසින් ලැබුණු ලිපි සභාගත කරන ලදී.

1. ලිපි ගොනු අංක 171 - විද්‍යාලයීය ප්‍රධාන සැලසුම (Master Plan) පිළිගැනීමට ලක්කිරීම සම්බන්ධව ලිපිය - ගාමිණි විජයසේකර මහතා

ධර්මපාල විදුහලට අවේනික අනන්‍යතාවය සුරැකීමේ අවශ්‍යතාවයට සාධකයක් වී ඇති සැළැස්ම ස්ථාපිත කිරීමේ යෝජනා

1. සැළැස්ම බලගැන්විම කමිටුවක් ස්ථාපිත කිරීම
2. විධායක සභාව විසින් මෙම කමිටුව බලගැන්වීම
3. මෙහි යෝජිත කාර්යයන් 2023 තුළ බලගැන්වීමට අදාල උපදේස් පත්‍රිකා සැකසීම

මෙම යෝජනාව අනුර අබේරත්න මහතා විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා ඉදිරි වර්ෂය තුළදී කමිටුවක් පත්කොට අවශ්‍යය නිර්දේශයක් හා ප්‍රතිපාදනයන් සැළසීමට කටයුතු කරන බව ප්‍රධාන ලේකම්තුමා දන්වා සිටින ලදී.

2. ලිපි ගොනු අංක 177 - බද්ධ සංවිධාන ආදි ශිෂ්‍ය සංගමයේ පිළිගැනීමට ලක්කිරීම - ප්‍රදීප් උඩුවන මහතා
   වර්තමානයේ ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාව සංශෝධනයන්ට ලක්කරමින් පවතින බැවින් පහත යෝජනා කරන බද්ධ සංවිධාන මේ වන විට සෘජුව හා වක්‍රව පාසල ආදි ශිෂය සංගමය සමග කටයුතු කරන බැවින් ඒවා පිළිගැනීමට ලක්කිරීමක් පිළිගැනීම සඳහා අවශ්‍ය නීති රාමුව සැකසීම සඳහා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින බව
   1. පාසල් සංවර්ධන සමිතිය
   2. ධර්මපාල විද්‍යාලයීය භාරය
   3. කොළඹ පරම විඥාර්ථ බෞද්ධ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සමිති සම්මේලනය
   4. ශ්‍රි ලංකා මහබෝධි සංගමය
   5. ශ්‍රී ලංකා බෞද්ධ විදුහල් ආදි ශිෂ්‍ය සමිති සම්මේලනය

මෙම යෝජනාව අනුර අබේරත්න මහතා ස්ථිර කරන ලදී.

## සාමාජික චාන්දනී වේරගල මහත්මිය

ඉහත යෝජනා ස්ථිර කිරීම පිළිබඳව හා පිළිගැනීමකට ලක්කිරීම පිළිබඳ අදහස් දැක්වූ අතර, "ධර්මපාල භාරය" සමිති අඥා පනත යටතේ ලියාපදංචි කොට පාර්ලිමේන්තු විශේෂ පනතක් යටතේ බලගන්වා ක්‍රියාත්මක වන බවත් නැවත එය ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවෙන් බලගැන්වීමක් අවශ්‍ය නොවන බවත්, දැනට වසර 10 ක පමණ සිට කිසිදු ප්‍රශ්ණයක් නොමැතිව ක්‍රියාත්මක වන බවත්, තවද පාසල් සංවර්ධන සමිතිය අධ්‍යාපන අමාත්‍යංශය යටතේ බල ගන්වා ඇති අවස්ථාවක ආදි ශිෂ්‍ය සංගමය යටතට පත්කිරීම අනවශ්‍ය බවත්, යෝජිත ඉතිරි සංවිධාන / සංගම් ද මේ අනුවම වෙන වෙනම ක්‍රියාත්මකව බලගන්වා ඇති අවස්ථාවක අප විද්‍යාලයේ ආදි ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවෙන් නැවත බලගැන්වීමක් අවශ්‍යය නොවන බව සභාවට පෙනවා දුනි.

මේ සම්බන්ධයෙන් සභාවේ මතය විමසා බහුතර කැමැත්ත මත කටයුතු කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බහුතරය එකග නොවුන බැවින් ප්‍රදීප් උඩුවන මහතාගේ යෝජනාව පිළිගත නොහැකි බව ලේකම්තුමා දන්වන ලදී.

ලිපි ගොනු අංක 188 - ආදි ශිෂ්‍ය සංගමයේ යටතේ "දම්පල් උරුමය" සුරැකීමේ සංවිධානය අනුබද්ධ සංවිධානයක් ලෙස පිළිගැනීම - ගාමිණි විජයසේකර මහතා

මේ වන විට "දම්පල් උරුමය" සුරැකීමේ සංවිධානය නමින් සංවිධානයක් පිහිටුවා ඇති බවත්, එහි ව්‍යවස්ථාව හා සාමාජික නාමලේඛණ ආදි ශිෂ්‍ය සංගමයට ලබාදී ඇති බවත් දන්වා ලිපියක් යොමුකොට ඇති අතර ඒ සඳහා අනුමැතිය මහා සභාවෙන් අපේක්ෂා කරන බව දන්වා ඇත.

මෙහි අරමුණු :- 1.සාර්ධර්ම වැඩමසටහන් ක්‍රියාත්මක කිරීම
2. අධ්‍යාපන කුසලතා සංවර්ධනය
3. අනාගාරික ධර්මපාලතුමන්ගේ ඡයාරූප ප්‍රදර්ශනය

4. අනගාරික ධර්මපාල චින්තනය, දැක්ම හා සේවාවන්ට අදාළ පොත්, ලේඛණ ලියා පළ කිරීම
5. පොහොය වැඩසටහන

මෙම යෝජනාව අනුර අබේරත්න මහතා ස්ථිර කරන ලදී.

**<u>ගරු විදුහල්පතිතුමිය - එම්.රූපසිංහ මහත්මිය</u>**

මෙම යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් බවත්, පාසලේ සාරධර්ම භාවිතය පිළිබඳව හා ධර්මපාල චින්තනය පිළිබඳව ප්‍රමාණාත්මක දැනුවත් හා අවබෝධයක් සිසු දරුවන් මෙන්ම ගුරු භවතුන්, ආදි සිසුන් හා දෙමාපියන් අතරත් නොමැති වීම තුළ විද්‍යාලය අපහසුතාවයට පත්වූ අවස්ථාවන් ඇති බවත් පෙන්වා දුනි.

**<u>ගරු විධායක සභාපති - දීපාල් හේරත් මහතා</u>**

ඉහත යෝජනාවේ යෝජිත අරමුණු දැනටමත් ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවේ පොදු අරමුණු වන බවත්, ඒ හා සමාන අරමුණු සහිත තවත්, සංවිධානයක් බිහිවීම සිදු නොවිය යුතු බව පෞද්ගලික මතය බවත් පෙන්වා දුනි. නමුත් මෙම සංවිධානයකට මව් සංගමය හා දශක කණ්ඩායම හා එක්ව ඔවුන්ගේ වාර්ෂික ව්‍යාපෘතීන් සඳහා අනුබද්ධව කටයුතු කිරීමේ හැකියාව හා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදිය හැකි බව පෙන්වා දුනි.

**<u>ගරු ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතා</u>**

මෙම සංවිධානය පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබාදෙන ලෙස ගරු නියෝජ්‍ය ලේකම්තුමා මගින් මෙහි යෝජනාකරු වන ගාමිණී විජයසේකර මහතා වෙත දන්වා ඇති බවත්, අදාළ නිතී රාමුව හා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව තම සංගමයේ මහා සභා වාර්තාව. නිළධාරි මණ්ඩලය, සාමාජික සංඛ්‍යාව ඇතුලු පූර්ණය කළ යුතු දත්ත සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බව දන්වන ලදී. ඒ අනුව සංවිධානය පිලිගැනීමට ලක්කිරීමට අදාළ කටයුතු සිදුකළ හැකි බව ද පෙන්වා දුනි.

**<u>75-11 ව්‍යවස්ථා සංශෝධනයට අදාළ යෝජනා</u>**

**<u>ව්‍යවස්ථා සංශෝධන කමිටු ලේකම් අනුර අබේරත්න මහතා</u>**

2022-2023 කාලය තුළ ව්‍යවස්ථා සංශෝධන කමිටුව විසින් සාමාජිකයින්ගේ අදහස් හා යෝජනා ලබාගත් බවත් ඒවා whatsApp හා සමාජ මාධ්‍ය තුළින් සාමාජිකත්වය දැනුවත් කිරීමට කටයුතු කළ බවත් පැවසීය. මේ සම්බන්ධයෙන් තවත් අදහස් හා යෝජනා වේ නම් ඉදිරිපත් කරන ලෙස ද දන්වන ලදී.

**<u>සාමාජික කේ. වී. පී. නිරෝෂණ</u>**

ව්‍යවස්ථා සංශෝධනයට එකග බවත්, එහෙත් මෙම සංශෝධන මහා සභාවේ 2/3 බහුතර කැමැත්ත සම්මත කර ගත යුතු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදි.

**<u>හිටපු ලේකම් - දුමින්ද සංජීව බාලසූරිය මහතා</u>**

ව්‍යවස්ථා සංශෝධනයක් වසරක් පාසා සිදුනොවිය යුතු බවත්, තම ධූරකාලය තුල ව්‍යවස්ථා සංශෝධනය ආරම්භ කළ මුත් රටේ පැවති කොවිඩ් වසංගතය හමුවේ සම්පූර්ණ කරගත නොහැකි වු බවත්, මේ සඳහා පූර්ණ කැපවීමෙන් කටයුතු කළ එවකට හිටපු නියෝජ්‍ය සභාපති දීපාල් මහතාට ස්තුති වන්ත වන බවත් පැවසීය.

වර්තමානයේ අපගේ අනුශාසක මතය ද වන පූර්ණ ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකිරීම අත්‍යාවශය බව තමාද පිළිගන්නා බවත් එය සුදුසු යැයි යෝජනා කරන බවත් පැවසීය. මෙ ව්‍යවස්ථා සංශෝධනයේ ද දශක හා අනු කණ්ඩායම් සඳහා පොදු ව්‍යවස්ථාවක් ද සැකසීම සුදුසු බව යෝජනා කරන ලදී.

මෙම යෝජනාව සුලක්ෂණ විදුරංග මහතා ස්ථිර කරන ලදී.

**<u>අනුශාසක සජිත් විපුල ද සිල්වා මහතා</u>**

2022-2023 ආදි ශිෂ්‍ය සංගමයේ අනුශාසකවරයෙකු ලෙස කටයුතු කළ තමාගේ අදහස ද අපගේ ව්‍යවස්ථාව ප්‍රවීන ව්‍යවස්ථා සම්පාදකවරුන්ගේ හා ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රවීන හා කණිෂ්ඨ අයගේ සැදුම්ලත් කමිටුවක් මගින් පූර්ණ සංශෝධනයකට ලක්කල යුතු බවයි. මෙම යෝජනාව හරේන්ද්‍ර වැලිවිට මහතා ස්ථිර කරන ලදී.

## සාමාජික හරේන්ද්‍ර වැලිවිට මහතා

අප විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ස්ථාපිත කිරීමේ දී කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාව පාදක කොට ගත් බව ද නමුත් කොළඹ නාලන්දා විද්‍යාලයේ ව්‍යවස්ථාව වඩා ස්වාධීන ශක්තිමත් එකක් බව ද එවන් ශක්තිමත් ව්‍යවස්ථාවක් අප විදුහලේ ආදි ශිෂ්‍ය සංගමයට ද තිබීමේ වැදගත්කම ගැන කරුණු දක්වන ලදි.

## ගරු විධායක සභාපති දීපාල් හේරත් මහතා

මේ සඳහා අවශ්‍ය පියවර එළැඹෙන විධායක සභාවේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය.

## විධායක සභික සීවලී වන්නිආරච්චි මහතා

අපගේ ව්‍යවස්ථාවේ අංක 2.1 යටතේ ආදි ශිෂ්‍ය සංගමයේ නාමය සිංහල භාෂාවෙන් තිබෙන බවත්, එය ඉංග්‍රීසි භෂාවෙන් භාවිත කිරීම තුල බාහිර පාර්ශව සමග හා බැංකු කටයුතු කිරීමේ පහසුවක් ඇති බවත්, එය සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එය PAST PUPILS’ ASSOCIATION OF DHARMAPALA VIDYALAYA ලෙස විය යුතු බව දක්වන ලදි.

එම යෝජනාව චාන්දනී වේරගල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

## 75.12 ගරු ප්‍රධාන ලේකම්තුමාගේ ස්තුති කථාව.

2022-2023 විධායක සභාවේ ගරු ප්‍රධාන ලේකම් ධුරය සඳහා තමා තෝරාපත් කර ගැනීම පිළිබඳ ප්‍රථමයෙන්ම ස්තුතිය පළ කරන ලදී.

පසුගිය කාලය තුළ අසනීප තත්ත්වයෙන් පසුවූ බැවින් මාස 2-3 ක කාලයක් විධායක සභාව නියෝජනය කිරීමට නොහැකි වුවද එම කාලය තුළ නියෝජ්‍ය ලේකම් ආසිරි ද සොයිසා මහතා එම වගකීම බාරගෙන අවශ්‍ය කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ස්තුති වන්ත වන බවත් ගරු විධායක සභාපති දීපාල් හේරත් මහතාගේ නොමඳ සහයෝගය ලැබුණ බවත්, සීවලී වන්නිආරච්චි මහතා ධනංජ ඇල්විටිගල මහතා ඇතුලු විධායක සභවේ සියලු දෙනා දක්වූ සහයෝගයට ස්තුතිවන්ත වන බව ද පැවසීය.

ගරු ලේකම්තුමාගේ ස්තුති කතාවෙන් අනතුරුව 2022-2023 සඳහා වූ විධායක සභාව ව්‍යවස්ථාව අනුව හා න්‍යායපත්‍රාණුකූලව ඉල්ලා අස්වන ලදී.

## 75.13 නව විධායක සභාව තෝරාපත් කර ගැනීම

2023-2024 වසරේ 76 වන විධායක සභාව තෝරාපත් කර ගැනීම සඳහා කටයුතු කිරීමේදී ගරු සභාපති/ විදුහල්පති එම්. රූපසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුවූ අතර මෙහි සටහන් තබා ගැනීම සඳහා හිටපු නියෝජ්‍ය ලේකම් ආසිරි ද සොයිසා මහතාට ගරු සභපති/විදුහල්පතිතුමිය විසින් ආරාධනා කරන ලදී.

සභාවේ කටයුතු ඉදිරියට මෙහෙයවීම සඳහා සාමාජික/ ප්‍රධාන නිවේදක වසන්ත වෙල්ගම මහතා කටයුතු කල අතර ගරු සභාපතිතුමියගේ අධීක්ෂණය යටත් ඉදිරි කටයුතු මෙහෙයවන ලදී.

ඒ අනුව ප්‍රධාන ලේකම් ධුරය සඳහා ප්‍රථමයෙන්ම අයෙකු තෝරාපත් කර ගැනීම සිදුකරන ලදී.

මේ සඳහා නාම යෝජනා එකක් පමණක් ලැබී තිබෙන බවත් ඒ අනුව නිතරගයෙන් ප්‍රධාන ලේකම් ධූරය ආසිරි ද සොයිසා මහතා තේරී පත්වන බවත් දන්වන ලදී. මෙවර සුවිශේෂී කරුණක් වන්නේ අප ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපතිධූරය සඳහා නව ව්‍යවස්ථා සංශෝධනයට අනුව 13.3 යටතේ විධායක සභාපති ධූරය සඳහා අපේක්ෂකයින් අතුරින් අයෙකු තෝරාගැනීමක් සිදුකළ යුතු විය. ඒ අනුව අපේක්ෂකයන් දෙදෙනෙකු ඉදිරිපත් වූ බවත් ඒ හිටපු විධායක සභාපති දීපාල් හේරත් මහතා සහ හිටපු නියෝජ්‍ය සභාපති ලලිත් රෝහණ වැලිකල මහතා බව සඳහන් කරන ලදී.

ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් යටත්ව මෙවන් අවස්ථාවක අයෙකු තෝරගැනීම සඳහා අනුශාසකවරුන්ගේ මතය විමසන ලදුව එම ලැබී තිබූ තීරණය 2023/03/22 වැනි දින පැවති විශේෂ විධායක සභා රැස්වීමේ දී ප්‍රකාශයට

පත් කළ බවත්, එදින පැමිණි  සියලු දෙනාගේ ඒකමතික  තීරණය මත රහස් ඡන්දයක් සඳහා යොමුවූ බවත්, එම රහස් ඡන්දය ප්‍රකාශ කිරීමට දින 2 1/2 ක කාලයක්  ලබාදුන් බවත්, ඒ අනුව විධායක සභික 39 දෙනා අතුරින් 31 දෙනෙකු ඡන්දය ප්‍රකාශ කොට ඇති අතර ඉන් ඡන්ද 26 ක් හිටපු විධායක සභාපති දීපාල් හේරත් මහතාට  හා ඡන්ද 04 ක් හිටපු නියෝජ්‍ය සභාපති ලලිත් වැලිකල මහතා ලැබී තිබූ අතර ප්‍රතික්ෂේප වූ ඡන්ද සංඛ්‍යාව 01ක් වූ බවත් ප්‍රකාශ  කරන ලදී.

ඒ අනුව වැඩි ඡන්ද 22 කින් හිටපු විධායක සභාපති දීපාල් හේරත් මහතා 2023 -2024 වර්ෂය සඳහා වන විධායක සභාවේ විධායක සභාපතිවරයා ලෙස තෝරාගෙන ඇති බවත් සභාවට දන්වන ලදී.

## හිටපු නියෝජ්‍ය සභාපති - ලලිත් වැලිකල මහතා

මෙම තෝරා ගැනීම සම්බන්ධයෙන් තමන් විරුද්ධ බවත්, විධායක සභාවක් විසින් විධායක සභාපතිවරයෙකු තෝරාගන්නේ නම් මහා සභාවක් අවශ්‍ය නොවන බවත් පැවසීය.

අනුශාසකවරුන් විසින් ලබා දී ඇති නිර්දේශයන් පිළිනොගන්නා අතර, ඔවුන්ට ව්‍යවස්ථාව පිළිබඳ නිසි දැනුමක් නොමැති බව එම තීරණයක් මත පැහැදිළි වන බව පැවසීය.

තමා 2023 -2024 සඳහා වන විධායක සභාපති ධුර අපේක්ෂකත්වයෙන් ඉල්ලා  අස්වන බවත්, තමාට තරග කොට විධායක සභාපති ධුරය දැරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් පැවසීය. මෙම තනතුර සඳහා තරග කරන ලෙස බෙහෝ ආදි ශිෂ්‍යයින් තමාට ආරාධනා කල බැවින් තමා තරග කල බවද පැවසීය.

අනුශාසක නිර්දේශයෙන් හා විධායක සභාව විසින් ඡන්දක් පැවැත් වූ බව තමා නොදන්නා බවද පැවසීය. ඉතිහාසය තුල තමා 02 වරක් සභාපතිධුරය ද ප්‍රධාන ලේකම් ධුරයන් ද  වරින්වර දරා ඇති බවත්, පාසලට විශාල මෙහෙවරක් තමා සිදුකොට ඇති බව ද පෙන්වා දුනි. එසේ හෙයින් මෙම ඡන්ද ප්‍රතිඵලය කෙසේවත් තමා අනුමත නොකරන බව ද නැවතත් ප්‍රකාශ කරන ලදී.

## සාමාජික ප්‍රදීප් උඩුවන මහතා

මනා ආදර්ශයක්  සපයමින් ගැටුමක් ඇති නොවන ලෙස කටයුතු කරමින් සිදුකළ ඉල්ලා අස්වීම පිලිබඳ ලලිත් වැලිකල මහතාට ගෞරවය ලබාදෙන බව පැවසීය. කෙසේ හෝ නිවැරදි විනිවිදභාවයෙන් යුතු ව්‍යවස්ථාවක අවශ්‍යතාවය ඉතා ඉක්මනින් ලැබිය යුතු බව මින් හැගෙන බවත්, ඒ සඳහා සැම එක්ව කටයුතු කරමු යැයි යෝජනා කරන බව පැවසීය.

## හිටපු ලේකම් දුමින්ද සංජීව  බාලසූරිය මහතා

විධායක සභාවකට තනතුරු පත් කර ගැනීමේ බලයක් ව්‍යවස්ථාවට අනුව නොමැති බව පැවසීය. එබැවින් මහා සභාවේදී මෙම තනතුරු පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

## සාමාජික හරේන්ද්‍ර වැලිවිට මහතා

මෙම ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම නිති විරෝධි බවත් ව්‍යවස්ථාවෙන් විධායක සභාවට බලය ලබා දී නැති බවත්, සියලු තෝරාපත් කර ගැනීම් සඳහා මහා සභාවේ අනුමැතිය හිමිවිය යුතු බවත්, වහාම මෙය ඉල්ලා අස්කර ගන්නා ලෙසත් පවසන ලදී.

## හිටපු ලේකම් - ගාමිණි විජයසේකර මහතා

මේ අනුගමනය කළ යුතු ක්‍රමවේදය ව්‍යවස්ථාවේ නොමැති බව  ද නමුත් ව්‍යවස්ථාවේ 33 ට අනුකූලව විධිවිධාන සලස්වනු නොලැබූ කරුණු යටතේ උප වගන්ති 33.1 ට  අනුකූලව විධායක සභාවට යෝජනා සම්මතයක් මගින් ක්‍රියා කළ හැකි හෙයින්,  එලෙස ව්‍යවස්ථාවේ අංක 33 වගන්තියෙන් කියවෙන අංක 33.1 උප වගන්තියට  අනුව කටයුතු කොට ඇති බව පෙනී යන බව ප්‍රකාශ ලදී.

මෙම ප්‍රශ්ණය හමුවේ නිවැරදි නිශ්චිත තීරණයක් සඳහා පැවති විධායක සභාව විසින් අනුශාසක මතය විමසා ඇති නමුත් ඔවුන් ද නැවත 39 දෙනෙකුගෙන් යුත් විධායක සභාවේ තීරණයකට යොමුකොට ඇති බවත් පෙන්වා දුනි. ඒ අනුව විධායක සභාව  ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය සලකා අදාළ කටයුතු මෙහෙයවා ඇති බවත්,  මෙහි තීරණය අනුශාසකවරුන් විසින් ලබා නොදීම තුළ සභාව බෙදීමකට ලක් වී ඇති බව නිරීක්ෂණය වන බව පැවසීය.

සභාවේ පොදු මතය වූයේ මෙම මහා සභාව තුළ බෙදීමක් ඇති කර ගත යුතු නොවන බව හා ඡන්ද වලට යොමු නොවිය යුතු බවයි.

## සාමාජික චාන්දනී වේරගල/ ගනේෂ් අබේසේකර මහත්ම මහත්මීන්

අප ආදි ශිෂ්‍ය සංගමයට කීර්තිමත් ඉතිහාසයක් ඇති බව ද අප සාමාජිකයින් ගැටුමකට හෝ බෙදීමකට කිසි විටකත් යොමු නොවිය යුතු බවද පවසමින් දීපාල් හේරත් මහතා හා ලලිත් වැලිකල මහතා යන දෙදෙනා අතරින් අප ලලිත් වැලිකල මහතා වෙනුවෙන් පෙනී සිටින බවත්. ඔහු කීර්තිමත් අරලිය සාමාජිකයෙකු බවත්, ඒ අනුව ලලිත් වැලිකල මහතා සිදුකළ ප්‍රකාශයට අනුව ඔහු ඉල්ලා අස්වීම ඉතා ඥාණාන්විත ක්‍රියාවක් හා මහත්මා ගතියක් බව නොබියව ප්‍රකාශ කරන බව පවසන ලදී.

එසේම ඉතා කාර්යශූර ලෙස පසුගිය වසර තුළ කටයුතු කළ හිටපු විධායක සභාපති දීපාල් හේරත් මහතාට ඉදිරි වසරේත් විධායක සභාපතිධූරය හෙබවීමට අශිර්වාද කරන බවත් සම්පූර්ණ සහයෝගය ලබාදෙන බවත් පැවසීය.

ලලිත් වැලිකල මහතා සමග මෙම තනතුර සම්බන්ධයෙන් දිගටම සාකච්ඡා කළ බව ද මෙම තනතුරු සඳහා ඉදිරිපත් නොවන ලෙස දිගින් දිගටම ඉල්ලීම සිදුකල නමුත් වෙනත් බලවේගයන් හමුවේ ඔහු ඉදිරිපත් වීම සිදුව ඇති බවත්, එහි ප්‍රතිඵල අද අත්විදීමට සිදුව ඇති බවත් ගනේෂ් අබේසේකර මහතා පෙන්වා දුනි.

එසේම අපගේ හිටපු අනුශාසකවරුන් වෙත දෝෂාරෝපණය කිරීම අනුමත නොකරන බව ද ඔවුන් විද්‍යාලයේ කිර්තිනාමය හා ආදි ශිෂ්‍ය අභිමානය වෙනුවෙන් ඉතා කාලෝචිත තීරණයක් දීමට කටයුතු කොට ඇති බව පෞද්ගලිකව දරණ මතය බවද පැවසීය.

## හිටපු අනුශාසක - සජිත් විපුල ද සිල්වා මහතා

මෙම තීරණ ගැනීමේදී අනුශාසකවරුන් 05 දෙනෙකු සම්බන්ධ වූ බවද ලංකාවේ ප්‍රවීන ව්‍යවස්ථා සම්පාදකයින් හා නීතිවේදීන් සමග සාකච්ඡා කොට මෙම තීරණයන් ලබාදුන් බවත්, මෙහිදී නිරීක්ෂණය වූ ප්‍රධානම කරුණ වන ව්‍යවස්ථාවේ ඇති අඩුපාඩු මුලින්ම නිවැරදි කර ගත යුතු යැයි යන නිර්දේශයන් මත පිහිටා තීරණයන් ලබාදුන් බව ද පැවසීය.

## ගරු ප්‍රධාන ලේකම් - ආසිරි ද සොසියා මහතා

2023-2024 වර්ෂය සඳහා වන නව විධායක කමිටුවේ තනතුරු සඳහා නාමයෝජනා යොමුකොට ඉන් නාම යෝජනා පිරික්සුම් කමිටුව විසින් නිර්දේශිත සුදුස්සන්ගේ නාමයෝජනා සහ විධායක සභාවට පත් වු නිලධාරි මණ්ඩලය පහත වේ.

- ✓ **විධායක සභාපති ධූරය - තනතුරු 01**
  1. ඩී. ඒ. පී. හේරත් මයා

- ✓ **නියෝජ්‍ය සභාපති ධූරය - තනතුරු 01**
  1. එස්. අනුර අබේරත්න මයා

- ✓ **ප්‍රධාන ලේකම් ධූරය - තනතුරු 01**
  1. එච්. ඒ. කේ. ද සොයිසා මයා

- ✓ **භාණ්ඩාගාරික ධූරය - තනතුරු 01**
  1. ඩබ්.කේ. ජී .මල්වත්තගේ මයා

- ✓ **උප සභාපති ධූරය - තනතුරු 03**
  1. එච්. එච්. ගිහාන් ආරියරත්න මයා
  2. රුසිරු වගීෂ බැලගම මයා
  3. එච්. එම්. චමිඳු සී. විජයවර්ධන මයා

- ✓ **නියෝජ්‍ය ලේකම් ධූරය - තනතුරු 01**
  1. කේ. වී. පී .නිරෝෂන මයා

- ✓ **<u>උප ලේකම් ධූරය - තනතුරු 01</u>**
  1. තවීන්ද්‍ර නයෝමාල් ඉඹුලාන මයා

- ✓ **<u>උප භාණ්ඩාගාරික ධූරය - තනතුරු 01</u>**
  1. එම්. එස්. උපාලි මයා

- ✓ **<u>සංස්කාරක ධූරය - තනතුරු 01</u>**
  1. ධනංජ ඇල්විටිගල මයා

- ✓ **<u>කාරක සභික ධූර - තනතුරු 11</u>**
  1. ජනකාන්ත සුගතදාස මයා
  2. පී. සුලක්ෂන විදුරංග මයා
  3. තිලිණි ශාලිකා තිලකරත්න මිය
  4. එච්. එස්. සී. ධර්මසේන මයා
  5. දිලිනි ලංකිකා ලියනගේ මිය
  6. ඩබ්. කේ. බී. කේ. ආර්. පී. කේ. පෙරේරා මයා
  7. එල්. ඒ. අරුණි රශ්මිකා ජයසිංහ මිය
  8. පෙවින්ද බැලගම මයා

කාරක සභිකයින් 11 දෙනෙක් පත් කර ගත යුතු අතර ඉතිරි 03 දෙනා මහා සභාවේ සාමාජිකයින් අතුරින් යෝජනා ස්ථිර කොට පත්කර ගන්නා ලෙස දන්වන ලදී. ඒ අනුව

රොහාන් වැලිවිට මහතා - යෝජනා කලේ - ගාමිණි විජයසේකර මහතා

ස්ථිර කලේ - අනුර අබේරත්න මහතා

ගාමිණි විජයසේකර මහතා - යෝජනා කලේ - අනුර අබේරත්න මහතා

ස්ථිර කලේ - සුසන්ත ආරියසිංහ මහතා

හරේන්ද්‍ර වැලිවිට මහතා - යෝජනා කලේ - අනුර අබේරත්න මහතා

ස්ථිර කලේ - ප්‍රදීප් උඩුවන මහතා

හරේන්ද්‍ර වැලිවිට මහතා විසින් තමා මෙම තනතුරින් ඉවත්වන බවත්, අවශ්‍ය විටෙක සහයෝගය ලබාදිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙම විධායක සභාව සඳහා තරුණ නියෝජනයන් අවශ්‍ය බව සභාවෙන් යෝජනා වු අතර ඒ අනුව චමින් හිමල්ක මහතා විසින් චතුර බණ්ඩාර මහතාගේ නම යෝජනා කළ අතර ඒ අනුව චතුර බණ්ඩාර මහතාගේ නම ස්ථිර කිරීම හරේන්ද්‍ර වැලිවිට මහතා විසින් සිදුකරන ලදී.

## <u>හිටපු අනුශාසක සජිත් විපුල ද සිල්වා මහතා</u>

අප ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභා නියෝජනය සඳහා යම් ප්‍රතිශත මට්ටමකින් තරුණ නියෝජිතයින් අත්‍යාවශ්‍ය බව පැවසීය. අපගේ වැඩිහිටි ආදි සිසුන් දූන් ක්‍රමයෙන් විශ්‍රාම යමින් සිටින නිසා ඔවුන්ගේ වෘත්තීයභාවය මත උපදේශාත්මක සේවය ලබාදීම වඩා කාලෝචිත බව පැවසීය. එහෙයින් ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාව මහා සභාව තුළින් සාමාජිකයන් නම් කිරීමේ දී තරුණ සහෝදරයින් යෝජනා කිරිම අප සැමගේ වගකීම බව ද පෙන්වා දුනි.

මෙම යෝජනාව ගරු විධායක සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## <u>75.14 ගරු සභාපති/ විදුහල්පතිතුමියගේ කතාව</u>

සෑම වසරකටම වරක් ආදි ශිෂ්‍ය සංගමයේ මහා සභාව ඇමතීමට ලැබීම භාග්‍යයක් සේ සලකන බවත් මව් සංගමයේ විධායක සභාව ඇතුලු සියලු දශක හා අනු කණ්ඩායම් වලට මෙන්ම බාහිරින් සිට පාසලට ආශිර්වාද කරන හා උදව් උපකාර කරන ආදි ශිෂ්‍යයන් සැමට තම කෘතඥතාව පල කරන බවත් පැවසීය.

අපගේ කීර්තිමත් ආදි ශිෂ්‍ය හිටපු ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතා තනතුර දරමින් විශාල සේවයක් කල බවද මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙමින් සහයෝගය දැක්වීම අගය කරන බවත් අදි දින ඉතා නිහතමානිව කටයුතු කරමින් ආදර්ශයක් සපයමින් ලලිත් වැලිකල මහතාගේ සේවය ද අගය කරන බවත් පෙන්වා දුනි.

ලලිත් වැලිකල මහතා තම ධූරකාලය තුල ධර්මපාල රාහුල මහා ක්‍රිකට් තරගයේදී විශාල වැඩකොටසක් සිදුකළ බවත් ඒ ඇසුරින් ඔහුගේ හැකියාවන් පිළිබඳ අත්දැකීමක් ලබාගැනීමට හැකි වු බවත් පැවසීය. ලලිත් වැලිකල මහතගේ සේවය මෙන්ම උපදේශනය ද ඉදිරියේ දී විද්‍යාලයට ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන බව පැවසීය.

පසුගිය විධායක සභාවෙන් ඉවත් වු රොහාන් වැලිවිට මහතා නැවත නව විධායක සභාවේ කමිටු සාමාජිකයෙකු වීම පිළිබඳ සතුටු වන බවද පවසන ලදී.

පසුගිය වසර තුළ පාසල නව පරිපාලන දිශානතියකට යොමු කිරීමට හැකිවීම හා නිසි කළමණාකරණයක් බිහිකිරිමට හැකියාවක් ලැබු බවත්, ඒ තුලින් පාසලේ ගුණාත්මක හා භෞතික සංවර්ධනයක් සිදුවී ඇති බව විශ්වාස කරන බවත් පවසන ලදී.

මේ සඳහා පාසලේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් ඇතුලු අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය විශාල සහයෝගයක් ලබාදෙන බව ද පෙන්වා දුනි. ආදි ශිෂ්‍ය සංගමය හා විදුහල යන දෙකම එකම අරමුණක පිහිටා කටයුතු කල යුතු බවත්, එම සුසංයෝගය පාසලේ දියුණුවට විශාල බලපෑමක් සිදුකරන බවත් පැවසීය.

තමා පාසලට පැමිණෙන විට පාසලේ ප්‍රධාන ශාලාව අබලන්ව හා ප්‍රතිසංස්කරණය කරමින් පැවති බවත්, ඒ සඳහා ඉතා වෙහෙස මහන්සියෙන් කැපවු සියලු පාර්ශවයන්ට ස්තුතිවන්න වන බව ද පවසන ලදී. පසුගිය වසරේ 01 වසර ළමුන් ඇතුළත් කරගැනීමේ දී පැවති ප්‍රථම රැස්වීම මෙම ශාලවේ ඉතා අපහසුවෙන් පැවැත්වූ බවත්, දූවිලි පිරුණු එම ශාලාව අදි දින ඉතා අලංකාර ශාලාවක් වී තිබීම ගැන සතුටු වන බව ද මෙවර පළමු වසර ළමුන් සඳහා පැවති උත්සවය ආඩම්බරයෙන් යුතුව පැවැත්වූ බව ද පවසන ලදී. තවද පසුගිය වසරේ පාසල් සංවර්ධන සමිති රැස්වීම ගඩොල් මත සිට පැවැත්වූව ද එළඹෙන 29 වන දින එනම් 2023/03/29 දින පැවැත්වීමට නියමිත පාසල් සංවර්ධන සමිති රැස්වීම මෙම ශාලාවේ පැවැත්වීමට අවස්ථාවක් ලැබීම සතුටට කරුණක් බවද පෙන්වා දුනි.

පාසලේ තාප්පයෙන් එපිට සිට පෙනෙන අලංකාර ධර්මපාලයට වඩා වෙනස් ධර්මපාලයක් තාප්පයෙන් ඇතුළත ඇති බවත් එය වහාම නිවැරදි විය යුතු බව හා ඒ සඳහා ක්‍රියාකිරීම අප සැමගේ වගකීම විය යුතු බව පෙන්වා දුනි.

දිවයිනේ අනෙකුත් පාසල් සමග සැසඳීමේ දී අප පාසල සතුව සුවිශේෂි ලක්ෂණ කිහිපයක් ඇති බවත් බොහෝ පාසල් වලට ආදි ශිෂ්‍ය දශක හා අනු කණ්ඩායම නැති බව ද අප සතු එම ශක්තිය තුළ ඔවුන් පාසල වෙනුවෙන් විශාල වැඩ කොටසක් සිදු කර ඇති බවත් ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත් අප පාසල කොළඹ පිහිට තිබුණ ද අප කොළඹින් පිටත පාසලක් බවත්, නමුත් කොළඹ පාසලකට වඩා වැඩි සම්පත් හා භූමි ප්‍රමාණයකට හිමිකම් කියන පාසලක් බව ද පෙන්වා දුනි. භෞතික හා මානව සම්පත් ප්‍රමාණාත්මකව අප සතු වුවත්, ඒවා නිසි කළමණාකරණය කර නොගැනීම තුළ අප දෙවන පෙළ පාසලක් බවට පත්ව ඇති බව ද පෙන්වා දුනි. අප පාසලින් බිහිවන දක්ෂ දරුවන් පාසල තුළම රඳවා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව ද අවධාරණය කරන ලදී.

ඉතා හොඳින් විභාග සමත්වන දරුවන් පාසලින් අස්කර ගැනීමට දෙමාපියන් විශාල බලපෑමක් කරන බව ද ඇතැම්විට දරුවන් ඊට අකමැති වුවද දෙමාපිය බලපෑම මත ඔවුන් අස්වන බවත් එය වළක්වා ගැනීමට අවශ්‍ය වටපිටාව අප දෙපාර්ශවයේම මැදිහත්වීම මත ඉටු කර ගත යුතු බව විශ්වාස කරන බව ද පෙන්වා දුනි.

අප පාසල තුළ දැඩි විනයක් හා බෞද්ධ දර්ශනය මත පදනම් වූ අනගාරික චින්තනය සහිත පාසලක් බවට පත්කිරීමට තමා උපරිම උත්සාහය ගෙන කටයුතු කරන බව ද අධ්‍යාපන ආමාත්‍යංශය අනුමත කොට ඇති "සති පාසල" සංකල්පය විද්‍යාලය තුළ ක්‍රියාත්මක කරන බවද පවසන ලදී.

විදුහල්පති ලෙස තමාගේ නව කළමණාකරණ දර්ශනය හා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම තුළ විද්‍යාලයේ අභිමානය, භෞතික හා ගුණාත්මක භාවය ඉහළට ඔසවා තැබීමට අවශ්‍ය සහයෝගය ආදි ශිෂ්‍ය සංගමය වෙතින් ලැබෙනු ඇතැය විශ්වාස කරන බව පවසමින් " ධර්මපාල නාමය සදා දිනේවා" පවසන ලදී.

## 75.15 2023-2024 නව විධායක සභාවේ අනුශාසක මණ්ඩලය හා විනය කමිටුව නම්කිරීම

නව අනුශාසක මණ්ඩලය ව්‍යවස්ථානුකූලව තවත් වර්ෂ 02ක් සඳහා නම් කිරීමට ප්‍රතිපාදන ඇති බැවින් පැවති අනුශාසත මණ්ඩලයට සුදුසු යැයි විධායක සභාපති දීපාල් හේරත් මහතා යෝජනා කළ අතර එම යෝජනා රොහාන් වැලිවිට මහතා ස්ථිර කරන ලදී.

විනය කමිටුව ද ව්‍යවස්ථානුකූලව ඉදිරියට තවත් වසර 02ක් සඳහා ප්‍රතිපාදන හිමිවී ඇති බවත්, එහෙත් විනය කමිටු සාමාජිකයින් අතුරින් ගාමිණි විජයසේකර මහතා නව විධායක සභාවට පත්වීමත් නෝමන් රණසිංහ මහතාගේ අභාවයෙන් පුරප්පාඩු වූ තනතුරු සඳහාත් දෙදෙනෙකු පත්කිරීමට යෝජනා කරන ලදී.

ඒ අනුව

හරේන්ද්‍ර වැලිවිට මහතා - **යෝජනා කලේ** - ගනේෂ් අබේසේකර මහතා

**ස්ථිර කලේ** - දීපාල් හේරත් මහතා

ගනේෂ් අබේසේකර මහතා - **යෝජනා කලේ** - ලෙනාඩ් රාජපක්ෂ මහතා

**ස්ථිර කලේ** - අනුර අබේරත්න මහතා

## 75.16 බාහිර විගණනය සඳහා ආයතනයක් නම් කිරීම

අප විසින් මෙතෙක් මෙම සේවාව ලබාගත් ආයතනය වන එච් ඩබ්.එම්. ඇසෝසියේෂන් ආයතනයම සුදුසු බව දීපාල් හේරත් මහතා යෝජනා කළ අතර ස්ථිර කිරීම චාන්දනි වේරගල මහත්මිය සිදු කරන ලදී.

## 75.17 නව අදහස් හා යෝජනා

### සාමාජික බුද්ධික රොෂාන් මහතා

ආදි ශිෂ්‍ය සංගමය විසින් වසරක් පාසා පාසලට විශාල වියදමක් දරමින් දශක හා අනු කණ්ඩායම් එක්ව භෞතික සම්පත් සංවර්ධනයන් හා නව ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර පාසලට භාර දෙන නමුත් ඒවා නිසි නඩත්තුවක් හෝ කළමණාකරණයකින් තොරව පරිපාලනය කරන බවත්, ඒ සඳහා නිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු බව යෝජනා කරන ලදී.

### ගරු භාණ්ඩාගාරික වසන්ත මල්වත්ත මහතා

ව්‍යවස්ථාවේ 25.5 උප වගන්තිය අනුව සංගමයේ බැංකු කටයුතු හා සම්බන්ධ ලිපි ලේඛන, චෙක්පත් සඳහා භාණ්ඩාගාරිකතුමාගේ අත්සන යෙදිය නොහැකි අවස්ථා වලදී විධායක සභාපතිතුමාගේ අත්සන සමග උප භාණ්ඩාගාරිකතුමාගේ අත්සන යෙදීම මින් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරන ලද අතර ඒ සඳහා සභාවේ අනුමැතිය හිමිවිය.

### ගරු සභාපති/ විදුහල්පතිතුමිය - එම්. රූපසිංහ මහත්මිය

මේ සඳහා පාසලේ කළමණාකාරීත්වය තුළ වැඩපිලිවෙලක් ඇති බවත්, එහෙත් දුවා දරුවන්ගේ විනය පිළිබඳ ගැටලු රැසක් ඇති අතර ඒවා යාවත්කාලීන කරමින් ඔවුන් දැනුවත් කර නිසි අධ්‍යාපනයක් ලබාදී එම භෞතික සම්පත් ආරක්ෂා කරගනිමින් පරිහරණය කිරීමට වැඩපිළිළෙක් සකස් කරන බව පැවසීය. ඒ සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය බව ද පෙන්වා දුනි. එසේම දෙමාපියන් ද මේ සම්බන්ධයෙන් වගවිය යුතු බව තවදුරටත් පැවසීය.

### හිටපු ලේකම් දුමින්ද බාලසූරිය මහතා

අද දින පැවති මෙම මහ සභාව ආදි ශිෂ්‍ය සංගමයේ වාර්ෂික මහා සභාවක් ලෙස නොව ව්‍යවස්ථා සම්පාදන සභාවක් ලෙස පෙනෙන බව සඳහන් කරන ලදී.

### ගරු සංස්කාරක ධනංජ ඇල්විටිගල මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ රැස්වීම් ශාලාවේ ඇති ප්‍රක්ෂේපණ යන්ත්‍රය (projector) කැඩී ඇති බවත්, එය භාවිත කිරීමේ ක්‍රමවේදය පිළිබඳ උපදෙස් මාලාවක් ලබාදී තිබුන ද එය නිසිලෙස භාවිත නොකිරීම මෙයට හේතුවී ඇති බවත් පෙන්වා දුනි.

මේ සඳහා යම් මිලක් තීරණය කොට භාවිත කරන අයගෙන් මුදල් අය කර ගැනීම සුදුසු බව යෝජනා කළ අතර ශාලක මුතුතන්ත්‍රී මහතා එය ස්ථිර කරන ලදි.

## හිටපු ලේකම් දුමින්ද බාලසූරිය මහතා

අපගේ ජ්‍යෙෂ්ඨ ආදි ශිෂ්‍ය හිටපු සභාපතිවරයෙකු වන විශ්‍රාමික ජනරාල් නීල් ඩයස් මහතාගේ යෝජනාවක් ලෙස ස්ථාපිත කළ "දම්පල් උයන" විද්‍යාලයේ නම් කළ භූමිය පාරිසරික වශයෙන් විශාල වටිනාකමක් ඇති භූමියක් බවත්, ඒ තුළ සිසුයෙන් වඳවන රතු ලැයිස්තුගත ශාක 06ක් රෝපණය කර ඇති බවත් එබැවින් " දම්පල් උයන" ව්‍යාප්‍තිවට ඇතුළත් කල යුතු යැයි යෝජනා කරන බව පැවසීය.

## ගරු සභාපති/ විදුහල්පතිතුමිය - එම්. රූපසිංහ මහත්මිය

මේ වන විට මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය ලිපි සකසා ඇති බවත් පාසල් සංවර්ධණ සමිතිය ද ඒ සඳහා සහය හා දායකත්වය ලබාදී ඇති බවත් පැවසීය.

## ගරු ප්‍රධාන ලේකම් - ආසිරි ද සොයිසා මහතා

අප විද්‍යාලය හා ආදි ශිෂ්‍ය සංගමය විසින් පවත්වාගෙන යන සමාජ ජාලා වෙබ් අඩවි/වට්ස් ඇප් ගිණුම් සියල්ල නිසි නියාමනයකින් තොරව භාවිතා වන බවත්, ඒ තුළින් වැරදි මත, කීර්ති නාමයට හානි වීම, පුද්ගලික පණිවිඩ වැනි දේ නිරතුරුවම ප්‍රචාරණය වන බවත් එය විද්‍යාලයේත්, ආදි ශිෂ්‍ය සංගමයේත් කීර්ති නාමයට හානි වන බැවින් එය නියාමනය කිරීමට කමිටුවක් පත්කල යුතු බව යෝජනා කළ අතර එම යෝජනාව හිටපු ලේකම් රොහාන් වැලිවිට මහතා සහ ගරු සභාපති/විදුහල්පතිතුමිය ද ස්ථිර කරන ලදී. ගරු විදුහල්පතිතුමිය ද එය අනුමත කරමින් ස්ථිර කරන ලදී.

## 75.18 ගරු විධායක සභාපතිතුමාගේ කතාව

පසුගිය වසරේ විධායක සභාපතිධුරය දරූ තමා මේ වසරේ ද ඡන්ද විමසීමකින් අනතුරුව තේරිපත් වූ බවත්, තමා මෙවර තරග කිරීමට අදහස් කළේ පාසල වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගමය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් කිපයක වැඩ අවසන් කිරීමට ඇති බැවින් බවත් පැවසීය.

අනෙකුත් තරගකරුවන්ට කෙසේ වෙතත් තමාට මෙම තනතුර සඳහා තරග කරන ලෙස කිසිවෙකු ආරාධනා නොකළ බවද තරග කොට තනතුරු ලබාගැනීමට අදහස් නොකළ නමුත් ඉතිරිව ඇති වැඩ කොටස නිමාකිරීම තුල ආදි ශිෂ්‍ය සංගමයටත්, මෙම ව්‍යාපෘතීන් සඳහා දායකත්වය අනුග්‍රහකත්වය ලබාදෙමින් තමා පිළිබඳ විශ්වාසයක් ඇතිව කටයුතු කල සියලු ආදි ශිෂ්‍යයින්ට දක්වන ගෞරවයක් ලෙස සලකා ඉදිරිපත් වූ බවද එම සත්ක්‍රියාව හිතේ දරගෙන ඉදිරිපත් වීම තුළ අපේක්ෂා නොකල අන්දමින් ජයග්‍රහණයක් හිමිවූ බවත් සියලුම විධායක සභිකයින්ට තම ගෞරව ප්‍රණාමය පල කරන බවත් පැවසීය. තවද මෙවර වෙනදාට වඩා අපට ගරු අනුශාසකවරුන්ගේ සහය ලබාගැනීමට සිදුවූ බවද ඔවුන්ගේ සේවය අපක්ෂපාතීව ලබාදී ඇති බව විශ්වාස කරමින් තම ප්‍රණාමය පළ කරන බවද පැවසීය.

මෙම තනතුර ලබාගැනීම සඳහා තරග කිරීමට සිදුවීම ජීවිතයේ සංවේදීම අවස්ථාවක් වූ බවත්, 1994 සිට තමා ආදි ශිෂ්‍ය සංගමයේ විවිධ තනතුරු හොබවා ඇති බවත් තමාව ආදි ශිෂ්‍ය සංගමයට සම්බන්ධ කරවූයේ ද ලලිත් වැලිකල මහතා බවත් දක්ෂ පුද්ගලයකු වන වැලිකල මහතා අද දින ඉතා නිහතමානිව සහයෝගය ලබාදීම අගය කරන බව ද පැවසීය.

ඉදිරි වර්ෂයේදී සැළසුම් සහගතව වැඩ අවසන් කිරීමට අදහස් කරන බව ද ඒ සඳහා පූර්ණ සහාය වත්මන් විධායක සභාවෙන්, ගරු විදුහල්පතිතුමියගෙන් හා ආදි ශිෂ්‍ය සංගමයේ සියලුම සාමාජිකයින්ගෙන් ලැබෙනු ඇතැයි විශ්වාස කරන බව ද පැවසීය.

පසුගිය වර්ෂයේ ආදි ශිෂ්‍ය කාර්යාලයේ සේවය කරන කාර්යය මණ්ඩලයේ නිශාන්ති, නිලූකා හා නෙරංජන් වැලිවිට විශාල සහයෝගයක් ලබාදෙමින් කටයුතු කළ බවත් මේ වසරේ ද එම සහය අපේක්ෂා කරන බව ද ඔවුන්ට තම ප්‍රණාමය පල කරන බවද පැවසිය.

## 75.19 ගරු ලේකම්තුමාගේ කතාව

75 වන විධායක සභාවේ නියෝජ්‍ය ලේකම් ලෙස තම ශක්ති ප්‍රමාණයෙන් උපරිම කාර්‍යක්‍ෂමතාවයකින් යුතුව වගකීම ඉටු කල බව විශ්වාස කරන බවත්, එසේ කිරීමට ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතාගෙන් හා ගරු විධායක සභාපති දීපාල් හෙරත් මහතාගෙන් විශාල සහයක් ලැබුන බවත් එසේම විධායක සභාවේ සියලුම සාමාජිකයන් මෙන්ම දශක හා අනු කණ්ඩායම් වල ද නොමද සහය ලැබුණු බව ද ඒ සඳහා සැමට ස්තූතිවන්ත වන බව ද පැවසීය.

එසේම හිටපු  විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශන මහතාගේ උපදේශනයන් හිටපු ලේකම් දුමින්ද බාලසූරිය මහතා, අරලිය සභාපතිනි චාන්දනී වේරගල මහත්මිය, අනුර අබේරත්න මහතා,  ගාමිණී විජයසේකර මහතා ජනරාල් නීල් ඩයස් මහතා, එයාර් මාර්ෂල්  ඔලිවර් රණසිංහ මහතා, සජිත් විපුල ද සිල්වා මහතා ඇතුලු ජ්‍යෙෂ්ඨයින්ගේ මග පෙන්වීම තුළ තමාට නියෝජ්‍ය ලේකම්ධූරය දැරීමට පහසු වූ බව ද ගරු විදුහල්පතිතුමිය ඇතුලු විද්‍යාලයේ  අධ්‍යයන කාර්ය මණ්ඩලය, පාසල් සංවර්ධන කමිටුව මෙන්ම තම දශක කණ්ඩායම් වන දම්පල් සංසඳ කණ්ඩායමේ සහයෝගය ද නිරතුරුව ලැබුණ බවත් ඔවුන්ට ද තම ප්‍රණාමය පළ කරන බවත් පවසන ලදී.

අද දින මෙම මහා සභාව සඳහා පැමිණි සැම ආදි ශිෂ්‍යයකුටම ස්තූතිවන්ත වන බවත්,  අද දින සිට තමා දරණ ප්‍රධාන ලේකම් ධූරයේ වගකීම උපරිමයෙන් යුතුව ඉටු කිරීමට අදහස් කරන බවත්, ඒ සඳහා සියලු සැම දෙනාගේම සහය අපේක්‍ෂා කරන බවත් පවසන ලදී. එසේම  ආදි ශිෂ්‍ය කාර්යාලයේ සේවය කරන කාර්යය මණ්ඩලයේ නිශාන්ති, නිලූකා හා නෙරංජන්  වැලිවිට විශාල සහයෝගයක් ලබාදුන් බවත් ඔවුන් වෙත විශේෂ ප්‍රණාමයක් පළ කරන බවත් පැවසීය.

වේලාව ප.ව 2.45 වි ඇති අතර මෙම සභාවේ වැඩ කටයුතු මෙතැනින් සමාප්ත කරන බව පවසමින් සභාව විසුරුවා හරින ලදී.

මෙයට

ප්‍රධාන ලේකම්
ආසිරි ද සොයිසා